**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය - 2016**

----------------------------------------

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම නීතිගත සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.5,679,700 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 වගන්තිය පරිදි වත්කමක් පාවිච්චිය ආරම්භ කළ දිනයේ සිට ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් ඊට පටහැනිව වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් අධිකාරිය විසින් අනුගමනය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 අනුව රු.6,788,124 ක් වූ තොග, අගය කිරීමේ පදනම සහ තොග සම්බන්ධයෙන් භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුළුව තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැටුප් රු.2,999,102 ක් සේවා නියුක්ත භාරකාර අරමුදලට ගෙවිය යුතු රු.89,973ක් හා සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු.359,892ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු.270,527 ක්වූ පාරිතෝෂික වියදම සහ පාරිතෝෂික වෙන් කිරීම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 ජනවාරි 17 වන දින අවලංගු කරන ලද රු.5,000,000 ක් වටිනා සත්නිවේදන තැන්පතුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී 2016 දෙසැම්බර් 31 දිනට අවලංගු කළා සේ සළකා මුදල් පොතට හර කර තිබීම හේතුවෙන් ආයෝජන එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, බැංකු හා මුදල් ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) අධිකාරිය සතු රු.5,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතුව වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට අදාළ රු.105,548 ක පොලී මුදල ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**------------------------------------**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ------- | ----------- | ------------------------ |
| | රු. | |
| ගොඩනැඟිලි | 228,550 | අයිතිය සහ භෞතික පැවැත්ම සනාථ කිරීමේ ලියවිලි |
| ලැබිය යුතු ශේෂ | 287,188 | ශේෂ සනාථ කිරීම් |
| ගෙවිය යුතු ශේෂ | 595,488 | |

**2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්**

**----------------------------------**

අධිකාරිය හා අලෙවි අංශය මඟින් පවත්වාගෙන යනු ලබන ගිණුම් හා උපලේඛන අතර අවස්ථා **04** කදී රු.**398,476** ක වෙනසක් පැවතුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.219,232 ක් වටිනා ලැබිය යුතු ශේෂ 37 ක් නිරවුල් නොකර පැවති අතර, එම ශේෂ වසර 01 සිට වසර 07 දක්වා කාල පරාසයකට අයත් විය.

(ආ) වර්ෂයකට අධික කාලයක් නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය නොවී පවතින රු.115,562 ක සේවක ණය ශේෂ 06 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ සේවයෙන් ඉවත් වී සිටි නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.239,533 ක සේවක ණය අදාළ නිලධාරියාගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.609,727 ක් වටිනා ගෙවිය යුතු ශේෂ 04 ක් නිරවුල් නොකර පැවති අතර, එම ශේෂ වසර 01 සිට වසර 10 දක්වා වූ කාල පරාසයකට අයත් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණු 2014 වර්ෂයේ සිට පැවත එන හඳුනා නොගත් "කාර්ය මණ්ඩල ණය ගැලපුම්" ගිණුමේ වූ රු.50,998 ක ශේෂය 2017 අගෝස්තු මාසය වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396(ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මාස 06 ඉක්මවූ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ රු.775,500 ක් වටිනා චෙක්පත් 207 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආයතනය තුළ ඇඟිලි සළකුණු යන්ත්‍රයක් ක්‍රියාත්මක වුවද ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් ලබාගත් පිටපතකින් පැමිණි හා පිටවූ වේලාවන් තහවුරු කර නොගෙන නිලධාරීන්ගේ පාලනය යටතේ පවත්වා ගන්නා ලද පැමිණීමේ ලේඛනය පදනම් කරගෙන රු.1,817,943 ක අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. |
| (ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | (i) 2016 දෙසැම්බර් 31 වන දින වන විට නොපියවූ තත්කාර්යය අතුරු අග්‍රිම ශේෂය රු.607,984 ක් වූ අතර එය පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>(ii) ආයතනයේ නිලධාරීන් විසින් 2016 වර්ෂය තුළදී අවස්ථා 30 කදී ලබාගත් රු.261,120 ක අත්තිකාරම් මුදල් අදාළ කාර්යය නිම වී දින 14 ත් දින 262 ත් අතර කාල පමාවකින් පියවා තිබුණි.<br>(iii) නිලධාරීන් 27 දෙනෙකුට ලබාදෙන ලද රු.365,280 ක අත්තිකාරම් මුදලින් රු.226,070 ක් ප්‍රයෝජනයට නොගෙන නැවත පියවා තිබුණු අතර එය සියයට 28 සිට සියයට 100 ක පරාසයක් විය. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1 ඡේදය | වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීඑම්එස්/ඊඅයි/14/05/115(VOL1) දරන ලිපියට අනුව කාර්යක්ෂමතා දීමනා ගෙවීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කර නැවත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත් 2017 මාර්තු 31 දින වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු නොකර 2016 වර්ෂය වෙනුවෙන් රු.619,440 ක කාර්යක්ෂමතා දීමනා ගෙවා තිබුණි.

(ආ) අලෙවි අංශයේ සේවකයින් වෙනුවෙන් අවදානම් තත්ත්වයකට මුහුණදීමට සිදුවන අවස්ථාවක වියදම් දැරීම සඳහා පිහිටුවා ඇති අවදානම් සංචිත අරමුදල වෙනුවෙන් 2011 සැප්තැම්බර් සිට 2016 දෙසැම්බර් 31 දක්වා ආයතනයේ අරමුදලින් බැර කරන ලද රු.469,457 ක් හා තව දුරටත් බැර කළයුතු රු.37,000 ක් වශයෙන් එකතුව රු.506,457 ක් සම්බන්ධයෙන් ක්‍රමවේදයන් හා නිර්ණායක සකස් කර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට කළමණාකාරීත්වය අපොහොසත් වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,359,802 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.798,108 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.561,694 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර පුනරාවර්තන ලැබීම් රු.1,639,421 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.32,601,898 ක් වූ ඌනතාවය 2013 වර්ෂයේදී රු.23,704,832 ක අතිරික්තයක් වී තිබුණි. 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අතිරික්තයක් නිරීක්ෂණය වුවද 2013 වර්ෂයට සාපේක්ෂව එම අතිරික්තයන්හි අඩුවීමක් නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.9,746,179 ක දායකත්වය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂයේදී රු.72,492,946 ක් වී තිබුණි.

### 3.2 අධිකාරියට එරෙහිව සහ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර පාර්ශවයන් විසින් අධිකාරියට එරෙහිව අධිකරණයේ නඩු 04 ක් පවරා තිබුණු අතර, අධිකාරියේ සම්පත් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් රු.40,178 ක මුදලක් අය කර ගැනීම සඳහා අධිකාරිය විසින් හිටපු සේවකයෙකුට එරෙහිව අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**4.1** **කාර්යසාධනය**

**-----------------**

1972 අංක 11 දරන කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත අනුව ආයතනයේ අරමුණු පහත දැක්වේ.

(අ) කෘෂිකාර්මික විවිධාංගිකරණය, ජනාවාස සංවර්ධනය සහ පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණය සඳහා සැලසුම් සකස් කිරීම සහ අමාත්‍යවරයා විසින් කලින් කළ නිශ්චය කරනු ලබන ප්‍රදේශවල සංස්ථාව විසින් හෝ ආණ්ඩුවේ නැතහොත් ආණ්ඩුවේ නොවන නියෝජිත ආයතන මඟින් හෝ එම සැලසුම් සම්බන්ධිකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම.

(ආ) සංස්ථාව වෙත සතු කරන ලද හෝ පවරන ලද සියලු ඉඩම්, උපරිම ඵලදාව, පරිසරය රැකීම, ඉඩම් සහ ජල සම්පත් සංරක්ෂණය සහ ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයෙන් කළමනාකරණය කිරීම.

(ඇ) කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම සහ අලෙවි කිරීම.

(ඈ) කෘෂිකාර්මික විවිධාංගිකරණය සහ ජනාවාස සංවර්ධනය සඳහා පිරියත, උපකරණ සහ යන්ත්‍රෝපකරණ පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ඉ) ඉහත (අ) ඡේදයෙහි නිශ්චිත ප්‍රදේශවල කෘෂිකාර්මික විවිධාංගිකරණය, ජනාවාස සංවර්ධනය සහ දියබෙත්ම කළමනාකරණය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන සියලු පියවර ක්‍රියාත්මක කිරීම.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කෘෂිකාර්මික විවිධාංගකරණය, ජනාවාස සංවර්ධනය, කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම, ආදී කටයුතු වර්ෂය තුළ සිදු කර නොතිබුණි.

(ii) සංවර්ධන කටයුතු සඳහා රු.57,650,130 ක මුදලක් භාණ්ඩාගාරය විසින් ලබාදෙනු ලැබුවද එම මුදලට අමතරව රු.5,588,163 ක් ආයතනය විසින් ද යොදවා පාංශු සංරක්ෂණ කටයුතු පමණක් සිදුකර තිබුණ අතර පනතේ සඳහන් වෙනත් සංවර්ධන කටයුතු කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

**(iii)** සැලසුම්කරණය හා ප්‍රගති සමාලෝචනය සඳහා ඇස්තමේන්තු ගත රු.350,000 ක මුදලෙන් රු.101,144 ක් හෙවත් සියයට 29 ක කාර්යයන් පමණක් සිදුකර තිබුණි.

(iv) සමස්ථ ඉලක්කය හා සමස්ථ ප්‍රගතිය සැලකීමේදී ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කළද ග්‍රාම නිලධාරී වසම් 25 කට අදාළව හෙක්ටයාර් 584.64 ක පාංශු සංරක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1978 වසරේ සිට පැවත එන ගිණුම් 03 කට අදාළව රු.2,081,413 ක සංචිත ශේෂයන් පවත්වාගෙන යාමේ අරමුණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අලෙවිසැලේ දෛනිකව එකතු වන මුදල් වහාම බැංකු ගත කළ යුතු වුවද 2016 දෙසැම්බර් 30 සිට 2017 ජනවාරි 10 දින දක්වා අවස්ථා 12 කදී රු.162,425 ක් සහ රු.1,111,401 ක් දක්වා පරාසයක් තුළ මුදල් අත රඳවාගෙන තිබුණි. සුළු වියදම් වෙනුවෙන් වැය කිරීම වෙනුවෙන් සුළු මුදල් අග්‍රිමය ලෙස රඳවාගත යුතු මුදල් සීමාවක් කළමනාකාරීත්වය මඟින් අනුමත කර නොතිබුණි.

(ඇ) සිසුන්ගේ, දෙමාපියන්ගේ ශ්‍රමදායකත්වය යටතේ සංවර්ධන වැඩසටහන් සිදු කළ යුතු වුවද ඉන් බැහැරව, පාසැල් 40 ක සකස් කරන ලද ආදර්ශන සඳහා රු.641,209 ක් හා පාංශු ආදර්ශන 11 කට අදාළව කුලී වශයෙන්රු.178,910 ක් බාහිර පාර්ශවයන්ට ගෙවා තිබුණි.

(ඉ) අලෙවිසැල සඳහා නොලැබුණු එළවළු වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවලදී වැඩිපුර ගෙවා තිබුණු එකතුව රු.1,739,764 ක් සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් රු.575,000 ක් පමණක් අයකර ගෙන තිබුණද ඉතිරි රු.1,164,764 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ඊ) අධිකාරියේ නිලධාරියෙකු පදිංචි වී සිටින රජයේ නිවාසය වෙනත් අමාත්‍යාංශයකට අයත් නිවාසයක් වූ අතර එය විධිමත් පරිදි පවරාගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගන්නෝරුව සහ අම්පාර අලෙවිසැල්වල මිලදී ගැණුම්වලට සාපේක්ෂව අපතය වටිනාකම් පිළිවෙලින් රු.1,899,383 ක් හෙවත් සියයට 2.3 ක් හා රු.302,418 ක් හෙවත් සියයට 17.8 ක් වූ අතර, ගන්නෝරුව අලෙවිසැලට සාපේක්ෂව අම්පාර අලෙවිසැලේ අපතය ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) පල්ලේකැලේ හා කොත්මලේ ගොවිපළවල 2015 වර්ෂයේදී පිළිවෙලින් රු.1,326,129 ක් හා රු.74,999 ක්ද, 2016 වර්ෂයේදී පිළිවෙලින් රු.219,382 ක් හා රු.153,649 ක් අලාභ ලබා තිබුණ ද වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ 2015 මාර්තු 04 දිනැති අංක 04/04/07 දරන ලිපියේ 07 ඡේදය පරිදි ව්‍යාපාර සැලැස්මක් සකස් කර ගොවිපලවල් ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ ව්‍යාපෘතින් වෙනුවෙන් මිලදීගත් වසර 05 කට වඩා පැරණි රු.716,170 ක් වූ කෘෂි උපකරණ 2017 ජනවාරි 05 දින වන විටත් ගබඩාවේ පැවතුණි.

(ආ) අක්කර 10 ක් පමණ වූ පල්ලේකැලේ ගොවිපළට අයත් මුළු ඉඩම් ප්‍රමාණය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) වැලිගම අලෙවිසැල සඳහා රු.124,707 ක් වටිනා භාණ්ඩ 2016 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී මිලදී ගෙන තිබුණු නමුත් 2017 ජුනි 30 දින වන විටත් වැලිගම අලෙවිසැල විවෘත කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම භාණ්ඩ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) 2014 වර්ෂයේ සංවර්ධන වැය ශීර්ෂයෙන් රු.5,442,792 ක් වැය කර අඩක් නිමකළ ඉංගිරිය අලෙවිසැල් ගොඩනැඟිල්ල විගණන දිනය වූ 2017 ජනවාරි 31 දින වන විටත් ඉදිකිරීම් අවසන් කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.5 කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ඉංගිරිය අලෙවි සැල**

**---------------------**

(i) කොන්ත්‍රාත්කරු වෙත ඉටු නොකරන ලද වැඩ අයිතමයන් 04 ක් සඳහා රු.105,100 ක් වටිනා ගෙවීම් කර තිබුණි.

(ii) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 වැනි පරිච්ඡේදයේ 4.1.1(ඇ) මාර්ගෝපදේශය අනුව ප්‍රතිපාදන ඇති බවට තහවුරු කර නොගෙන රු.1,223,499 ක් වටිනා අලෙවි මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් 2014 අගෝස්තු 07 දින ආරම්භ කර අඩක් නිමකර ඇතත් මුදල් නොමැතිවීම නිසා 2017 ජුනි වන විටත් ඉදිකිරීම් අතරමග නවතා තිබුණි.

(iii) එළවළු හා කෘෂි ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා ඉදිකරන ලද අලෙවිසැලේ ඉදිකිරීම් කටයුතු සඳහා අදියර 09 ක් යටතේ රු.16,570,000 ක ඇස්තමේන්තුවක් සකස් කර එම ඇස්තමේන්තුව අනුමත කර තිබුණද තවදුරටත් අවශ්‍ය රු.10,570,164ක අරමුදල් සපයා ගැනීම සම්බන්ධයෙන් සැලැස්මක් සකස් කර නොතිබුණි.

(iv) අලෙවිසැලේ ඉදිකිරීම් කටයුතු අදියර 4 ක් යටතේ සිදු කිරීමට එකතුව රු.6,478,698 කට ඇස්තමේන්තු සකස්කර තිබුණි. එයින් අදියර 3 ක් සඳහා පමණක් ලංසු කැඳවා මිල ගණන් ඉදිරිපත් කර තිබුණු එකම ලංසුකරු වෙත අදියර 4 හිම ඉදිකිරීම් පවරා තිබුණි.

**(ආ) වැලිගම අලෙවිසැල**

**---------------------**

(i) 2014 පළාත් නැඟුම වැඩසටහන යටතේ රු.8,062,196 ක් සහ හදබිම අධිකාරියෙන් රු.2,112,501 ක් වැයකර අඩක් නිමකර 2015 ඔක්තෝබර් 18 දින අධිකාරියට භාරදී තිබුණු අලෙවිසැල් ගොඩනැඟිල්ලේ ස්ථාන කිහිපයකම බිත්ති පුපුරා ඉරිතලා ගොස් තිබුණු අතර, ඇතැම් ස්ථානවල වේයන් විසින් හුඹස් බැඳ තිබුණි. ඒවා නැවත සකස් කර අලෙවි කටයුතු ආරම්භ කිරීමට 2017 මාර්තු 27 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ii) බිල්පතෙහි සඳහන් රු.44,086 ක ඉටු නොකරන ලද අයිතම 03 ක් සඳහා ගෙවීම් කර තිබුණි.

(iii) පවුඩර් කෝර්ටඩ් ග්ලාස් දොරවල් (Powder Corted glazed door) වෙනුවෙන් රු.150,132 ක මුදලක් ගෙවා තිබුණද එම දොරවල් සඳහා පවුඩර් කෝර්ටඩ් පමණක් යොදා ඇති අතර ග්ලාස් යොදා නොතිබුණි.

(ඇ) 2016 වර්ෂය තුළදී රු.1,081,657 ක් වටිනා ද්‍රව්‍ය මිලදී ගැනීම් හා රු.528,700 ක පවිත්‍රතා සේවාව වෙනුවෙන් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 හා 8.9.1(ආ) මාර්ගෝපදේශ අනුව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර ලිඛිත ගිවිසුමකටද එළඹ නොතිබුණි.

**4.6 වියිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

---------------------------------------------------------------------------

2017 ජූනි 30 දින වන විටත් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් 02 ක පිළිවෙලින් රු.5,442,792 ක් හා රු.10,174,698 ක් වැය කර අලෙවිසැල් 02 ක් ඉදිකර තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජූනි 15 දිනැති අංක ඩීඑම්එස්/1578 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය පරිදි අනුමත කර තිබුණු කාර්මික සහායක තනතුර සඳහා 2017 මාර්තු 31 වන විටත් බඳවා ගැනීම් සිදුකර නොතිබූ අතර, බඳවා ගැනීම් පරිපාටියද අනුමත කර ගෙන නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 04 දෙනෙකුගේ කොන්ත්‍රාත් කාලය අවසන් වී තිබියදීත් ගිවිසුමක් නොමැතිව හා කාලය දීර්ඝ කිරීමකින් තොරව 2015 නොවැම්බර් සිට 2017 මාර්තු දක්වා කාලය සඳහා දළ වැටුප් වශයෙන් රු.2,203,880 ක් ගෙවා තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ මූල්‍ය නිලධාරී හා මුරකරු තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන 2017 පෙබරවාරි 28 දින තෙක් වැටුප් වශයෙන් රු.409,945ක් ගෙවා තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 71(i)(ආ) රෙගුලාසියෙන් බැහැරව අලෙවි ව්‍යාපෘතිය යටතේ අනුමත අලෙවි සහායක තනතුරු 21 තුළට බිල්පත් එකතු කරන්නා ලෙස තනතුරු නාමය වෙනස් කරමින් නිලධාරීන් 06 දෙනෙකු බඳවාගෙන 2016 වර්ෂය තුළ වැටුප් වශයෙන් රු.1,756,754 ක් ගෙවා තිබුණි.

**4.8 වාහන උපයෝජනය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජූලි 15 දිනැති ලිපියට අනුව රු.1,120,000 ක් වූ අත්ට්‍රැක්ටර් 10 ක් ගොවි සංවිධාන වෙත පවරා දීමට අනුමැතිය ලබාදී වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද පවරාදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයට නිත්‍යානුකූල අයිතිය පවතින පිරිවැය රු.900,000 ක ලොරි රථයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 5.2 ඡේදය අනුව අලෙවි ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන සැලැස්ම අදාල වර්ෂය ආරම්භ වීමට පෙර පිළියෙල කර අනුමත කරවා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ ලේකම් විසින් 2016 මාර්තු 31 දින අනුමත කර තිබුණු අතර සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර නොතිබුණි. අනුමත කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ රු.1,832,698ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ii) අධිකාරිය වෙනුවෙන් 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර 2016 වර්ෂයේ අලෙවි ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගැනීම් සඳහා පිළියෙල කරන ලද රු.41,900,000 ක ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ජාතික ප්‍රසම්පාදන සංග්‍රහය අනුව ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

---

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සහ අලෙවි ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය එක් නිලධාරියෙක් පමණක් වූ අතර, අභ්‍යන්තර විගණනය වෙනුවෙන් මිනිස් පැය 3900 ක් භාවිතා කර ක්ෂේත්‍ර 09 ක් යටතේ ක්‍රියාකාරකම් 33 ක් සිදු කිරීමට සැලැස්මක් සකස් කර තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරකම් 06 ක් පමණක් ආවරණය වන පරිදි විගණන විමසුම් 14 ක් පමණක් නිකුත් කර විගණකාධිපති වෙත යොමුකර තිබුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 63,238,292 ක් සංවර්ධන වියදම් සඳහා වැයකර තිබුණද ඒ සම්බන්ධයෙන් එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි

**5.4 අයවැය ලේඛනමය පාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 5.2.1 ඡේදය අනුව අයවැය ඇස්තමේන්තුව සමඟ අයවැය ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් හා ක්‍රියාකාරී සැලැස්ම සමඟ අයවැය ගත ප්‍රාග්ධන වියදම් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 5.2.5 ඡේදය අනුව යාවත්කාලීන කරන ලද අවසන් අයවැය වාර්තාව වර්ෂය ආරම්භ වීමට දින **15** කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර 5.2.4 ඡේදය අනුව කෙටුම්පත් අයවැය වාර්තාවක් වර්ෂය ආරම්භ වීමට මාස 03කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව තුළ ඇතුළත් රු.1,888,500 ක් වටිනාකමැති වියදම් විෂයයන් 07 ක සංශෝධනයන් සඳහා 2017 ජනවාරි 22 දින අනුමැතිය ලබාගෙන තිබුණි.

(ඈ) ඉහත නිරීක්ෂණ අනුව අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ අනෙකුත් ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් 2004 වර්ෂයට පෙර සිට අයවිය යුතු රු.2,094,280 ක මුදල පිළිබඳ 2010 වර්ෂයේ පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී අවධානය යොමුකර එය විසඳීමට නියමකර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ද එය නිරවුල් කර ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගිණුම්කරණ ප්‍රමිති හා ප්‍රතිපත්ති නිසි පරිදි අනුගමනය නොකිරීම. |
| (ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | වර්ෂ ගණනාවක සිට පැවත එන ණය ශේෂ පියවීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම/ශේෂ සනාථ කිරීම් නොමැතිවීම. |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා පැවතීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත නොවූ තනතුරු සඳහා බඳවා ගැනීම හා පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) වාහන පාලනය | **(i)** වාහන පාලනය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම.<br>**(ii)** මාසික සාරාංශ සකස් නොකිරීම. |
| (ඊ) අභ්‍යන්තර විගණනය | **(i)** පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම.<br>**(ii)** අභ්‍යන්තර විගණන සැලැස්මට අනුකූලව කටයුතු කර නොතිබීම. |

| | |
|---|---|
| (උ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කර නොතිබීම. |
| (ඌ) අයවැය ලේඛනමය පාලනය | අයවැය ලේඛනය සකස් නොකිරීම හා මූලා පාලන කාරකයක් ලෙස යොදා නොගැනීම. |
| (එ) වත්කම් පාලනය | නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම් පැවතීම |